# ප්‍රධාන කරුණු ලේඛනය (KFD) - කෙටි කාලීන ණය (STL)
# මර්චන්ට් බෑංක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී

1 ණය වර්ගය - කෙටි කාලීන ණය

මෙම ණය මුදල ප්‍රධාන වශයෙන් ව්‍යාපාර හා කර්මාන්තවල නියැලෙන්නන්ගේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු කර ඇති අතර උපරිම වසර දෙකක කාල සීමාවක් දක්වා ලබාගත හැකිය. එම ණය කාල සීමාව තුල ගනුදෙනුකරු විසින් මාසිකව පොළිය ගෙවීමට අවශ්‍ය වන අතර මුළු ණය මුදල වසර 2ක කාලයක් තුළ ගෙවා අවසන් කල යුතුය.

2. ප්‍රධාන ලක්ෂණ සහ ප්‍රතිලාභ

- අ) ආකර්ෂණීය පොළී අනුපාත.
- ආ) අවම ණය අනුමත කිරීමේ කාලය
- ඇ) ආපසු ගෙවීමේ කාලය අවුරුදු 2 දක්වා
- ඈ) සුහද හා කඩිනම් සේවාව

3. සුදුසුකම්: අදාල අයදුම්කරු/අයදුම්කරුවන්

- අ) වයස අවුරුදු 18ට වැඩි සහ අවුරුදු 65ට අඩු ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය
- ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, වෘත්තිකයන් හෝ ස්ථිර අදායම් ලබන්නෙකු වීම.
- ඇ) ආපසු ගෙවීමේ හැකියාව (ආපසු ගෙවීමේ හැකියාව ප්‍රත්‍යක්ෂ ලෙස පිළිගත හැකිවීම)
- ඈ) පැහැදිලි CRIB වාර්තාවක් තිබීම. (සතුටුදායක CRIB වාර්තා)
- ඉ) පහසුකමේ අරමුණ නීතිමය / සදාචාරාත්මක විය යුතුය

4. පොලී අනුපාත සහ අනෙකුත් ගාස්තු

4.1 පොලී අනුපාත

පවතින වෙළඳපොල තත්ත්වයන්ට හා නීතිමය කාල සීමාවන්ට යටත්ව ණය කාල සිමාව, සුරැකුම් ස්වභාවය ආදිය මත කළමනාකාරිත්වය විසින් කලින් කලට තීරණය කරනු ලැබේ

4.2 වෙනත් ගාස්තු

4.2.1. පවත්නා ලේඛන ගාස්තු

| | |
|---|---|
| රුපියල් මිලියන 1.00 දක්වා | 7,500.00 |
| රුපියල් මිලියන 1.0 - රුපියල් මිලියන 5.00 | 12,500.00 |
| රුපියල් මිලියන 5.0 - රුපියල් මිලියන 12.5 | 27,500.00 |
| රුපියල් මිලියන 12.5 - රුපියල් මිලියන 15.00 | 35,000.00 |
| රුපියල් මිලියන 15.0 ට වැඩි පහසුකම් | ණය කමිටුව විසින් තීරණය කරනු ලබයි |

4.2.2. නීති ගාස්තු - නිශ්චල දේපල හිමිකම් ඇප මත ලබාදෙන ණය පහසුකම්

ආරක්ෂාව ලෙස පිරිනමනු ලබන නිශ්චල දේපලවල හිමිකම් තක්සේරු කිරීම සහ හිමිකම් වාර්ථා සකස් කිරීම සඳහා බැංකුවේ ලියාපදිංචි නීතීඥයින් සඳහා ගෙවිය යුතු ගාස්තු සහ උකස් බැඳුම්කර සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා MBSL බැංකුවේ ලියාපදිංචි නීතීඥයින් විසින් අය කරන ගාස්තු පහත දක්වා ඇත

1. හිමිකම් පරීක්ෂාව සහ හිමිකම් වාර්තාව සකස් කිරීම - රුපියල් 7,500/-

2. උකස් බැඳුම්කර පිළියෙල කිරීමේ සහ සම්පාදනය කිරීමේ නෛතික ගාස්තු 1%

4.2.3. ගාස්තු - චංචල දේපළ මත ලබාදෙන ණය පහසුකම්
රජයේ අනුමත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පැවරුම් ගාස්තු අදාල වේ

4.2.4 නියමිත දිනට මාසික වාරික නොගෙවීම / ප්‍රමාද වී ගෙවීම මත අය කරන දඩ පොලිය
නියමිත දිනට වාරික නොගෙවන්නේ නම් ප්‍රමාද වූ කාල සීමාව මත මසකට සියයට තුනක (3%) ප්‍රමාද ගාස්තුවක් අය කෙරේ.

4.2.5 ණය පහසුකම කලින් නිරවුල් කිරීම:/ පියවීම
නියමිත දිනට පෙර එකවර ණය මුදල ගෙවා පියවීමේදී ඉදිරි පොලියෙන් යම් සහන ප්‍රතිලාභයන් සැලසීම MBSL හි පූර්ණ අභිමතයට යටත්වේ

4.2.6 අදාළ වෙනත් අය කිරීම්

| අංකය | අය කිරීම් / ගාස්තු විස්තරය | අය කිරීම් / ගාස්තු (රු) |
|---|---|---|
| 1 | ශේෂය තහවුරු කිරීම | 1,000.00 |
| 2 | ඔප්පුවේ සහ සැලැස්මේ සහතික කල පිටපතක් | 750.00 |
| 3 | හිඟ මුදල් නොමැති බවට සහතික කෙරෙන ලිපි | 250.00 |
| 4 | පාරිභෝගික ප්‍රතිගෙවුම් ඉතිහාසය | 250.00 |
| 5 | පරම අයිතිය අහෝසි කිරීමේ ලිපියේ අනු පිටපතක් | 2,000.00 |
| 6 | විරෝධතාවක් නොමැති බවට සහතික කෙරෙන ලිපි. | 1,000.00 |
| 7 | ශේෂය තහවුරු කිරීම | 1,000.00 |
| 8 | ණය නිරවුල් කිරීමේ / ණය පියවීමේ ලිපි | 750.00 |
| 9 | ණය දෙන්නන් / ගැනුම්කරුවන් වෙත යවන ඉන්වොයිස් පත් | 1,500.00 |
| 10 | අගරු වූ චෙක්පත් ගාස්තු | 2,500.00 |
| 11 | අගරු වූ චෙක්පත් - ආදායකයා මුදල් ගෙවීම නතරකර ඇත | 5,000.00 |
| 12 | උකස්කර නිදහස් කිරීමේ ඔප්පු පිළියෙල කිරීම සහ ඒවායේ අත්සන් කිරීම සඳහා නෛතික ගාස්තු (අස්ථානගත වූ ඔප්පු සඳහා) | 7,500.00 |

5. ලබා ගත යුතු ඇප සුරැකුම් සහ ප්‍රදානය කළ යුතු අනාවෘත කිරීම්

-මුදල් සහ / හෝ ඉල්ලුම් / කාල තැන්පතු

කල්පිරීමේ දී පොලී ගෙවන තැන්පතුවක් නම්, තැන්පතුවෙන් 100% ක් දක්වා.

-නිශ්චල දේපළ

බැංකුවේ ලියාපදිංචි තක්සේරුකරුවෙකු විසින් ලබා දී ඇති දේපළෙහි බලහත් විකුණුම් වටිනාකමෙන් (Forced Sale Value) 75% ක් දක්වා.

-චංචල දේපළ

බැංකුවේ ලියාපදිංචි තක්සේරුකරුවෙකු විසින් ලබා දී ඇති දේපළෙහි බලහත් විකුණුම් වටිනාකමෙන් (Forced Sale Value) 70% ක් දක්වා.

-ලයිස්තුගත කොටස්

වෙළඳපළ වටිනාකමෙන් 200% ක් දක්වා

-කල්තබාගත හැකි කොටස්

වෙළඳපළ වටිනාකමෙන් 200% ක් දක්වා

6. අනුගමනය කළ යුතු ක්‍රියා පටි පාටිය

- ණය ගැනීමට කැමති සියලු ගනුදෙනුකරුවන්ට ළඟම ඇති ශාඛාවට පැමිණ ඔවුන්ගේ අවශ්‍යතා ගැන සාකච්ඡා කර ගත හැක.
- සාකච්ඡාවෙන් පසුව, ශාඛාව පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය අනුව ඇගයීමට ලක් කර ක්‍රියාවලිය ආරම්භ කරනු ඇත.
- ණය අනුමැතිය ආයතනික නීති රීති මාලාවට යටත්ව සිදුකෙරෙන අතර, ණය අනුමත කිරීමේ හෝ නොකිරීම පූර්ණ අභිමතය MBSL සතුවේ.

7.1 අවශ්‍ය ලියකියවිලි

7.1.1 පුද්ගල අයදුම්කරුවන්

i. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය / වත්කම් ප්‍රකාශ පත්‍රය
ii. ජාතික හැඳුනුම්පත (NIC පිටපත)
iii. බිල්පත් සාධනය/ බිල්පත් තහවුරුකිරීමේ ලේඛනය (ලිපිනය තහවරු කිරීමේ ලේඛනය)
iv. පසුගිය මාස 6ක බැංකු ප්‍රකාශ (පුද්ගලික සහ ව්‍යාපාරික)
v. මුදල් ප්‍රවාහ ප්‍රකාශ/ආදායම් වියදම් ප්‍රකාශ/වැටුප් වාර්තා
vi. CRIB වාර්තාව (පුද්ගලික සහ ව්‍යාපාරික) ලබා ගැනීම සඳහා අනුමැතිය
vii. ව්‍යාපාරයක් නම් ලියාපදිංචි ලේඛනයේ (BR) පිටපත (තිබේ නම්)
viii. වෙනත් ආදායම් සනාථ කරන ලියකියවිලි

7.1.2 ආයතනික ගනුදෙනුකරුවන්
සීමිත වගකීම් සමාගම්/ලැයිස්තු ගත සමාගම්

i. සංස්ථාගත කිරීමේ සහතිකය
ii. සමාගමේ ව්‍යවස්ථාවලිය
iii. පෝරමය 1, නවතම පෝරමය 13, පෝරමය 15, පෝරමය 20 පිටපත්
iv. බදු ගෙවීමේ රිසිට්පත්/ ආදායම් බදු (නවතම).
v. අධ්‍යක්ෂක මණ්ඩල යෝජනාව හා අනුමැතිය
vi. පසුගිය වසර තුන විගණනය කරන ලද ගිණුම්.
vii. වර්තමාන වර්ෂයේ කළමනාකරණ ගිණුම්/මුදල් ප්‍රවාහ ප්‍රකාශ
viii. පසුගිය මාස 6ක බැංකු ප්‍රකාශන
ix. CRIB වාර්තාව (ව්‍යාපාර/ අධ්‍යක්‍ෂවරු)
x. වෙනත් අවශ්‍ය ලියකියවිලි.

8. සුරැකුම  සම්බන්ධ ලියකියවිලි - දේපල හිමිකම් ඇප මත

8.1 උකස් දේපළ

- වත්මන් හිමිකරුගේ හිමිකම් ඔප්පුවේ මුල් පිටපත
- වසර 10ක් ඇතුලත අදිනලද ඉඩමේහි පිඹුරේ මුල්පිටපත (ප්‍රවේශ මාර්ගය අඩි 10)
- පළාත් පාලන ලේඛන සහ බදු රිසිට්පත
- පත්ඉරු ( වසර 30ක්වත් ආවරණය වන)
- ඔප්පු පිළිබඳ වාර්තා
- තක්සේරු වාර්තාව
- අදාල නිසි බලධාරියාගේ ලිඛිත අවසරය /අනුමැතිය (ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, වෙරළ සංරක්ෂණ අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය ආදිය.)
- ඉඩමේ ගොඩනැගිල්ලක් තිබේ නම්, අනුමත ගොඩනැගිලි සැලැස්ම
  අනුමත බලධාරීන්/කළමනාකාරීත්වය විසින් ඉල්ලා සිටින වෙනත් ඕනෑම ලියකියවිලි

ඉදිකිරීම් නම්
- අනුමත ගොඩනැගිලි සැලැස්මේ සහතික කළ පිටපතක්
- BOQ / පිරිවැය ඇස්තමේන්තුව (අදාළ නම්)

8.2 සුරුකුම් සම්බන්ධ ලියකියවිලි - චංචල දේපළ

- ලියාපදිංචි කිරීමේ මුල් සහතිකය
- වාහනයේ පරම අයිතිය,
- තක්සේරු වාර්තාව

9.සාමාන්‍ය

- ස්ථානයේ (නාම පුවරුව සමඟ)/අදාල දේපලහි ඡයාරූප
- ස්ථානීය පරීක්ෂණ වාර්තාව
- ණය අවශ්‍යතාවය තහවුරු කිරීම සඳහා ලේඛන
- අනෙකුත් ලියකියවිලි

10. ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

1 මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් කරනු ලබන පෙර දැනුම් දීමකින් තොරව හෝ බැංකුව විසින් ඉල්ලා සිටිනු ලැබීම මත හෝ ඕනෑම අවස්ථාවක බැංකුව විසින් නියම කරනු ලබන පරිදි අයදුම්කරුවන් තම ණය මුදල ආපසු ගෙවිය යුතු ය.

2 මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයෙහි පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව, ඉහත 2.1 වන වගන්තියෙහි දක්වා ඇති දේපළ මත දැනට අයදුම්කරුවන් විසින් භුක්ති විඳිනු ලබන කිසියම් අයිතිවාසිකමක්, කවර වුවද ආකාරයකින් බදු දීමට, කුලියට දීමට හෝ පවරා දීමට අයදුම්කරුවන්ට කිසිදු අවසරයක් නොමැත.

3 අදාළ දේපළ මත යම් උකසක්, ලියන් (LIEN) හෝ වෙනත් යම් පිළිබැඳුමක් ඇති නොකරන බවට හෝ ඇති කිරීමට නොසලස්වන බවට අයදුම්කරුවන් වග බලා ගත යුතු ය.

4 අයදුම්කරු සතු ව්‍යාපාරයේ පොත් පරීක්ෂා කිරීමට මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයට අයිතිය ඇත.

5 අයදුම්කරුවන්, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයෙහි පූර්ව අනුමැතියකින් තොරව, වෙනත් යම් ආයතනවලින් ණය පහසුකම් කිසිවක් ලබා නොගත යුතු ය.

6 හිඟ මුදල් අයකර ගැනීම සඳහා අයදුම්කරුගේ ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය වෙත මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයෙහි නිලධාරීන්ට පැමිණීමට බලය ඇති අතර, එබඳු පැමිණීම් වෙනුවෙන් වැය වූ වියදම් අයදුම්කරුවන් විසින් දැරිය යුතු ය.

7 ව්‍යාපාර පරීක්ෂා කිරීමේ කාර්යයන් සඳහා, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි පරිදි, අයදුම්කරුගේ සහ / හෝ ඇපකරුවන්ගේ ව්‍යාපාරික පරිශ්‍ර හෝ පදිංචි ස්ථාන වෙත ඇතුලු වීමට මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයට අයිතිය ඇත. එවැනි ව්‍යාපාර පරීක්ෂාවක්, අදාළ අයදුම්කරු සහ / හෝ ඇපකරුවන් වෙත කෙරෙන පූර්ව දැනුම්දීමක් සහිතව හෝ රහිතව සිදු කළ හැකි ය.

8 අදාළ පාර්ශව විසින් සහසන් කරනු ලබන පහසු බැංකු අයිරා ණය ගිවිසුමක මෙම ණය පහසුකමට අදාළ අනෙකුත් සියලු නියමයන් සහ කොන්දේසි අඩංගු විය යුතු අතර, එම ණය ගිවිසුම, මෙම අර්පණ ලිපියේ කොටසක් සහ අංගයක් ලෙස ආබද්ධව පැවතිය යුතු ය.

9 මෙහි අඩංගු විධිවිධාන ප්‍රකාරව මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් ණය පහසුකම අවසන් කරනු ලබන අවස්ථාවක දී, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය වෙත ගෙවීමට නියමිත සියලු හිඟ මුදල්, මුද්දර ගාස්තු හා නෛතික ගාස්තු යනාදිය ඇතුළු අදාළ නීතිමය ක්‍රියාපටිපාටි වල දී දරනු ලබන සියලු වියදම් ද සහිතව, ආපසු අයකර ගැනීම සඳහා හෝ සපයනු ලැබ ඇති ඇප මුදවා ගැනීමේ අයිතිය අහෝසි කිරීම සඳහා, අදාළ අයදුම්කරුට / අයදුම්කරුවන්ට සහ/හෝ ඇපකරුට / ඇපකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය හිමිකම් ලබන්නේ ය.

10 අයදුම්කරුවන් විසින් ණය පහසුකමේ වටිනාකම සඳහා උකස්කර අවධානම අඩු කිරීමේ රක්ෂණාවරණයක් ලබාගෙන එය MBSL වෙත පවරනු ලැබිය යුතුය.

11 අයදුම්කරුවන් විසින්, අදාළ ණය පහසුකමේ වටිනාකමට සරිලන ගිනි රක්ෂණ ඔප්පුවක්, පිළිගත් රක්ෂණකරුවකු වෙතින් ලබා ගත යුතු අතර, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය නමින් එය පවරා දෙනු ලැබිය යුතු ය. තවද, එබඳු රක්ෂණ ඔප්පුවක් වාර්ෂිකව අලුත් කර මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය වෙත භාර දිය යුතු ය. ඉහත දැක්වෙන පරිදි කරුණු පිළිපැදීමට අපොහොසත් වුවහොත්, එම රක්ෂණ ඔප්පුව අලුත්

කිරීමේ අයිතිය, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය සතු වන අතර, ඊට අදාළ ගාස්තු අයදුම්කරුගේ ණය ගිණුමට හර කිරීමට කටයුතු කරනු ඇත.

12 ඉහත සඳහන් කළ වාහනයේ පරම අයිතිකරු ලෙස මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය ලියාපදිංචි කළ යුතු අතර, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් නියම කරනු ලබන පරිදි හා නියම කරනු ලබන අවස්ථාවේ දී, එහි ලියාපදිංචි අයිතිය මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය වෙත පැවරිය යුතු ය. අයදුම්කරුට වාහනය තම සන්තකයේ තබා ගැනීමට හිමිකම ඇති නමුත්, ඉල්ලා සිටි විට, එහි සන්තකය මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය වෙත භාර දිය යුතු ය. මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනය විසින් අවශ්‍යයැයි සලකනු ලබන ඕනෑම අවස්ථාවක හෝ ස්ථානයක එම වාහනය තම සන්තකයට ගැනීමටත්, අවශ්‍ය විටෙක, ස්වකීය අභිමතය පරිදි සුදුසු ඕනෑම ආකාරයකින් වාහනය බැහැර කිරීමටත් මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයට හිමිකම ඇත.

13 අයදුම්කරුවන් විසින් රථවාහනයේ වටිනා කම සදහා පිළිගත හැකි රක්‍ෂණ කරුවෙකුගෙන් විස්තීරණ (පූර්ණ) රක්‍ෂණාවරණයක් ලබා ගත යුතු අතර, එය MBSL වෙත පවරනු ලැබිය යුතුය. ඉහත කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වුවහොත් එය අලුත් කිරීමේ අයිතිය MBSL රදවා තබා ගන්නා අතර, ගාස්තු අයදුම්කරුගේ ණය ගිණුමට හර කරනු ලැබේ.

11. අවසන් කිරීම සහ ප්‍රතිසාධන - නීතිමය ක්‍රියා පටිපාටි

MBSL විසින් මෙම පහසුකම අවසන් කරන්නේ නම්, MBSL විසින් මෙහි අඩංගු පෙර තිබූ ආකාරයටම අයදුම්කරුට/ඇයට සහ/හෝ ඇපකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමටත්, MBSL වෙත හිඟ මුදල් ආපසු අයකර ගැනීම සඳහා සපයා ඇති සුරැකුම්පත් බැංකුව වෙත ලබාගැනීමටත් හිමිකම් ඇත. (මුද්දර ගාස්තු, නෛතික ගාස්තු යනාදිය ඇතුළුව නීතිමය කටයුතු වලදී දරනු ලබන සියළුම වියදම් ද සමඟ)

11.1 පහත නීතිමය විධිවිධාන අදාළ වේ

i) සංශෝධිත 1946 අංක 06 දරන උකස් පනත

ii) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත

iii) ගිවිසුම් නීතිය

iv) ශ්‍රී ලංකාවේ සිවිල් සහ අපරාධ නීතිය

v) 2009 අංක 49 දරන සුරක්ෂිත ගනුදෙනු පනත

vi) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීම

vii) 1995 අංක 11 බේරුම්කරණ පනත

viii) 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත

ix) 1990 අංක 2 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත

x) 1990 අංක 14 දරන දේශීය භාර ලැබීම් පනත

xi) 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත

xii) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

12. පැමිණිලි හැසිරවීමේ පටිපාටිය

ගනුදෙනුකරුවන්ට අපගේ සේවා සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය;

ආ) ළඟම ඇති ශාඛාව වෙත ගොස් ශාඛා කළමනාකරු වෙත පැමිණිල්ල ඉදිරිපත් කිරීම

ආ) අපගේ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය 011 - 4 711 711 හරහා හෝ විද්‍යුත් තැපෑලෙන් - info@mbslbank.com / customercare@mbslbank.com හරහා පැමිණිලි කරන්න.

ඇ) තැපෑලෙන් - ලිඛිතව පැමිණිල්ලක් කිරීම ;

සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ - නිෂ්පාදන කළමනාකරණ,
දේපළ වෙළඳාම් සහ පාරිභෝගික පැමිණිලි හැසිරවීම, සහාය සේවා,
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
අංක 28, BOC මර්චන්ට් කුළුණ, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

**"සැක සහිත ගණුදෙණු සහ නියමිත සීමාවෙන් ඉහල ගනුදෙනු (මිලියන 1 ට වැඩි) මූල්‍ය බුද්ධි අංශයට වාර්තා කෙරේ"**